**රාජාංගනය ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජාංගනය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ හිඟ ටෙන්ඩර් බදු කුලී රු.15,183 ක් ආයතනයට ගෙවිය යුතු ටෙන්ඩර් ඇප තැන්පතුවලින් හිලව් කිරීමේදී එම වටිනාකම ගෙවිය යුතු ටෙන්ඩර් ඇප තැන්පතු ගිණුමට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයට අදාළ මෝටර්ග්‍රේඩර් කුලී ආදායම් හා JCB කුලී හිඟ ආදායම් ලැබීම් රු.511,350 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී වත්කම් විකිණීමෙන් රු.351,000 ක් මුදලින් ලැබී තිබුණු නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය තුළ වත්කම් විකිණීමෙන් ලද ලාභය රු.74,000 ක් හා අලාභය රු.94,700 ක් ලෙස සඳහන් කර තිබීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය රු.371,700 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ඉවත් කරන ලද ජෙනරේටරයට අදාළ සමුච්චිත ක්ෂය රු.73,200 ක් වුවත් වත්කම් විකිණීමේ ලාභය ගණනය කිරීමේදී එය රු.24,000 ක් ලෙස ගලපා තිබීම නිසා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ජෙනරේටරය විකිණීමේ ලාභය රු.49,200 ක් අඩුවෙන් හඳුනාගෙන තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කරන ලද ජෙනරේටරයකට හා ජල බවුසරයකට අදාළව ක්ෂය පිළිවෙලින් රු.19,200 ක් හා රු.21,870 ක් අඩුවෙන් ගණනය කිරීම නිසා ක්ෂය වටිනාකම රු.41,070 කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළදී ඉවත් කරන ලද වතුර බවුසරයකට අදාළ සමුච්චිත ක්ෂය වටිනාකම රු.73,170 ක් වුවත් වත්කම් විකිණීමේ ලාභය ගණනය කිරීමේදී එය රු.24,300 ක් ලෙස අඩුවෙන් ගළපා තිබුණි. | -එම- | -එම- |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.2,442,797 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව ප්‍රමාණවත් විගණන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පිළිගන්නා බව. | තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.8,712,211 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.12,036,604 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,360,500 | 1,534,240 | 973,440 | 44,400 | 1,014,700 | 1,617,910 | 1,170,710 | 497,600 |
| (ii) | කුලී | 11,802,082 | 10,058,192 | 9,588,502 | 5,285,163 | 8,919,882 | 8,793,831 | 4,316,508 | 4,815,473 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 318,000 | 423,530 | 335,530 | 226,425 | 397,975 | 520,755 | 284,180 | 356,425 |
| (iv) | වෙනත් ආදායම් | 19,163175 | 7,502,844 | 7,130,990 | 7,369,404 | 31,105,544 | 5,675,559 | 6,929,288 | 6,997,550 |
| | | 32,643,757 | 19,518,806 | 18,028,462 | 12,925,392 | 41,438,101 | 16,608,055 | 12,700,686 | 12,667,048 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශවල පිහිටියා වූ නිශ්චල දේපලක් හෝ නිශ්චල දේපල වර්ගයක වාර්ෂික වටිනාකම පාදක කරගෙන වරිපනම් බදු අයකළ යුතු වුවත් නව ප්‍රදේශ හඳුනාගෙන පනතේ උපදෙස් ප්‍රකාරව වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. | වරිපනම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු රු.15,000 ක්, ව්‍යාපාර බදු 29,400 ක්, වෙළඳ බලපත්‍ර ගාස්තු 226,425 ක් සහ හිඟ ජල ගාස්තු රු.877,710 ක් අයකර ගෙන නොතිබුණි. | -එම- | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | 2022 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසාන වනවිට රු.504,956 ක යන්ත්‍ර කුලී ආදායමක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කරගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.4,780,213 ක් විය. | පිළිගන්නා බව. | -එම- |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වනවිට උසාවි දඩ රු.3,355,922 ක් සහ මුද්දර ගාස්තු රු.808,500 ක් අයකරගෙන නොතිබුණි. | රු.1,356,169 ක් පමණක් ලැබිය යුතුව ඇති බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය සභාවේ පරිහරණයට 1993 වසරේ සිට ලබාදී ඇති කැබ්රථය අළුත්වැඩියා කිරීමට නොහැකිව ධාවනයෙන් ඉවත්කර නිශ්කාර්යව පැවතුණි. | ප්‍රධාන ලේකම් කාර්යාලයට පවරාදීමට කටයුතු කරන බව. | කඩිනමින් පවරාදීමට කටයුතු කළ යුතුය. |